00029

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලාව) උපාධි වැඩසටහන - හයවන මට්ටම

අවසාන පරීක්ෂණය - 2014

ESU4216 - තුලනාත්මක අධ්‍යාපනය

කාලය - පැය තුනයි.

---

දිනය - ~~2014.03.06~~ 26.02.2014 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

I වන කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑ ම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. "සෑම ගුරුවරයකුට ම තුලනාත්මක අධ්‍යාපනය පිළිබඳ දැනුවත්භාවයක් අත්‍යාවශ්‍ය වේ". තුලනාත්මක අධ්‍යාපනය විෂයය හැදෑරීමෙන් ගුරුවරයකුට ලැබෙන ප්‍රයෝජන තුනක් (03) සඳහන් කරන්න.

02. ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ක්‍රමයේ පැවති ආයතන තුන (03) නම් කරන්න.

03. ඔබ විසින් නම් කරන ලද එක් ආයතනයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

04. ගෝලීයකරණය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධනයට බලපෑ ආකාර තුනක් (03) ක් දක්වන්න.

05. වර්ධනය හා සංවර්ධනය අතර වෙනස කෙටියෙන් විස්තර කරන්න.

06. පාසලින් ළමුන් ගිලිහීමට බලපාන සාධක තුනක් (03) නම් කර ඉන් එක් සාධකයක් පිළිබඳව කෙටි විමර්ශනාත්මක විග්‍රහයක් කරන්න.

07. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් විෂයමාලාවේ ඇති කළ ප්‍රධාන වෙනස්කම් දෙකක් (02) දක්වන්න.

08. එංගලන්තයේ බට්ලර් පනත මගින් හඳුන්වා දුන් පාසල් වර්ග මොනවා දැයි දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)



13

## II වන කොටස

09. (i) ශ්‍රී ලංකාවේ පැරණි පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ පැවති විෂයමාලාවේ ස්වභාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(iii) පැරණි අධ්‍යාපන ක්‍රමයේ දුබලතා දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව පත් කළේ ඇයිදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) විශේෂ කාරක සභා වාර්තාව මගින් කරන ලද නිර්දේශ 4 ක් දක්වන්න. (ලකුණු 08)

(iii) ඉන් එක් නිර්දේශයක් ලංකාවේ අධ්‍යාපනයට බලපෑ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) බහු සංස්කෘතික සමාජය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) බහු සංස්කෘතික සමාජයක් ලෙස ශ්‍රී ලංකාව මුහුණ දෙන අධ්‍යාපනික ගැටලු හතරක් (04) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ඉහත ඔබ සඳහන් කළ ගැටලු විසඳීම සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 09)

12. (i) ජපානයේ ද්විතියික අධ්‍යාපන ක්‍රමයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04)

(ii) ජපානයේ ද්විතියික අධ්‍යාපන ක්‍රමය තුළ දක්නට ඇති ප්‍රධාන ගැටලු විස්තර කරන්න. (ලකුණු 08)

(iii) එම ගැටලු ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනයත් සමඟ සංසන්දනය කරන්න. (ලකුණු 08)

13. (i) සංවර්ධනය වන රටවල්වල දක්නට ලැබෙන අධ්‍යාපනික ගැටලු හතරක් (04) ක් නම් කර ඉන් එක් අධ්‍යාපනික ගැටලුවක් පිළිබඳව කෙටි විග්‍රහයක් කරන්න.

(ලකුණු 10)

(ii) සම අධ්‍යාපන අවස්ථා ව්‍යාප්ත කිරීමේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලු විස්තර කරන්න. අවශ්‍ය තැන්හි උදාහරණ දක්වන්න. (ලකුණු 10)

14. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) බෞද්ධ අධ්‍යාපන යුගයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවල ඵලදායිතාව

(ii) එක්සත් රාජධානියේ ද්විතීයික අධ්‍යාපනය

(iii) 1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

(iv) ඉන්දියාවේ ජාතික විවෘත පාසල

(v) අධ්‍යාපනය හා තොරතුරු තාක්ෂණය

හිමිකම් ඇවිරිණි.

(ලකුණු 10 x 2 = 20)